# පාසල් වාර සටහන

## *பாடசாலைத் தவணை அட்டவணை*

## School Calendar

# 2023

**Ministry of Education,**
**"Isurupaya",**
**Pelawatta,**
**Battaramulla.**

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/06/05/01-2023
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.03. 17

**චක්‍රලේඛ අංක - 10/2023**

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

**පාසල් වාර සටහන - 2023**

01. 2023 වර්ෂය තුළ අනුගමනය කළ යුතු පාසල් වාර සටහන සහ අදාළ විස්තර පහත දැක්වේ.

**I. සිංහල හා දෙමළ පාසල් සඳහා**

| | |
|---|---|
| පළමුවන වාරය | <u>පළමු වන අදියර</u><br>2023.03.27 සඳුදා දින සිට 2023.04.04 අඟහරුවාදා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.04.05 දින සිට 2023.04.16 වන දින දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ)**<br><br><u>දෙවන අදියර</u><br>2023.04.17 සඳුදා දින සිට 2023.05.12 සිකුරාදා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.05.13 දින සිට 2023.05.24 වන දින දක්වා 2022- අ.පො.ස.( සාමාන්‍ය පෙළ) විභාගය සඳහා නිවාඩු ලබා දෙනු ලැබේ)**<br><br><u>තෙවන අදියර</u><br>2023.05.25 බ්‍රහස්පතින්දා දින සිට 2023.07.20 බ්‍රහස්පතින්දා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.07.21 දින සිට 2023.07.23 වන දින දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| දෙවන වාරය | 2023.07.24 සඳුදා දින සිට 2023.10.13 සිකුරාදා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.10.14 දින සිට 2023.11.12 වන දින දක්වා 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගය - 2023 හා අ.පො.ස. (උසස් පෙළ) විභාගය - 2023 සඳහා නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| තෙවන වාරය | <u>පළමු අදියර</u><br>2023.11.13 සඳුදා දින සිට 2023.12.22 සිකුරාදා දින දක්වා (දෙදින ම ඇතුළුව)<br>**(2023.12.23 දින සිට 2024.01.01 වන දින දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ)**<br><br><u>දෙවන අදියර</u><br>2024.01.02 අඟහරුවාදා දින සිට 2024.02.09 සිකුරාදා දින දක්වා (දෙදින ම ඇතුළුව) |

**කරු.අ.පි.බ.**

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

II. මුස්ලිම් පාසල් සඳහා

| | |
|---|---|
| පළමුවන වාරය | <u>පළමු අදියර</u><br>2023.04.24 සඳුදා දින සිට 2023.05.12 සිකුරාදා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.05.13 දින සිට 2023.05.24 වන දින දක්වා 2022- අ.පො.ස.( සාමාන්‍ය පෙළ) විභාගය සඳහා නිවාඩු ලබා දෙනු ලැබේ)**<br><br><u>දෙවන අදියර</u><br>2023.05.25 බ්‍රහස්පතින්දා දින සිට 2023.07.20 බ්‍රහස්පතින්දා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.07.21 දින සිට 2023.07.23 වන දින දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| දෙවන වාරය | 2023.07.24 සඳුදා දින සිට 2023.10.31 අඟහරුවාදා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.11.01 දින සිට 2023.11.12 වන දින දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| තෙවන වාරය | <u>පළමු අදියර</u><br>2023.11.13 සඳුදා දින සිට 2023.12.22 සිකුරාදා දින දක්වා (දෙදින ම ඇතුළුව)<br>**(2023.12.23 දින සිට 2024.01.01 වන දින දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ)**<br><br><u>දෙවන අදියර</u><br>2024.01.02 අඟහරුවාදා දින සිට 2024.02.09 සිකුරාදා දින දක්වා (දෙදින ම ඇතුළුව) |

02. ඒ ඒ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලට තම පළාත්වල සුවිශේෂී තත්වයනට අනුකූලව පාසල් වාර සටහන වෙනසක් කළ යුතු බව අදහස් කරන්නේ නම් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව හා 1997 අගෝස්තු මස 08 දිනැති අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්ගේ අංක 97/15 දරණ චක්‍රලේඛයට අනුව මෙම වාර සටහන වෙනස් කර ගත හැකිය.

2.1. පාසල් වාර සටහන සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1997 අගෝස්තු මස 08 දිනැති අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්ගේ අංක 97/15 දරණ චක්‍රලේඛයට අනුව ලංකාවේ සියලුම පාසල් වර්ෂයකට දින 210ක් පැවැත්විය යුතු බව අවධාරණය කර ඇතත්, 2023 වර්ෂයට යෙදෙන රජයේ නිවාඩු දිනයන් සහ පාසල් වර්ෂය 2023 මාර්තු මස 27 වන දින ආරම්භ වන බැවින්, දින 210ක් පාසල් පැවැත්වීමට නොහැකි වී ඇත. එබැවින්, 2023 වර්ෂය සඳහා රජයේ හා රජයේ අනුමත සියලු ම පෞද්ගලික පාසල් හා අනුමත පිරිවෙන්, දින 179ක් පැවැත්විය යුතු වේ.

2.2. 2023 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය ඔක්තෝම්බර් මාසය තුළ සහ 2023 - අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය 2024 වර්ෂයේ මුල් භාගයේ දී පැවැත්වීමට නියමිතව ඇති බැවින්, පාසල්වල ඔක්තෝම්බර් නිවාඩු කාලය වාර සටහනෙහි දක්වා ඇති ආකාරයෙන් ම ලබාදිය යුතු වේ.

03. රජය මඟින් ප්‍රකාශිත ප්‍රසිද්ධ නිවාඩු දින, ඉරිදා දිනයන් හා වාර නිවාඩු කාලයන් තුළ සියලු ම පාසල් වසනු ලැබේ. එහෙත් සුවිශේෂී හේතුවක් මත පාසල පැවැත්විය යුතු දිනයක පාසල වැසීමට සිදු වුවහොත් එම දින සඳහා හිලව් සැසි පැවැත්විය යුතු වේ.

04. 2023 වර්ෂයට අදාළ රජයේ නිවාඩු දින දර්ශනය මේ සමඟ ඔබ වෙත යොමු කරන අතර (ඇමුණුම-I), පාසල් ක්‍රියාකාරකම් ඇතුළත් දින දර්ශනය අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි (www.moe.gov.lk) පළකිරීමට කටයුතු කරනු ලැබේ.

කරු.අ.පි.බ.

මෙම වාර සටහන ක්‍රියාත්මක කිරීමේ දී යම් ගැටළුවක් පැන නැගුණහොත් ඒ පිළිබඳ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් විමසන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

දුරකථන අංක - 011- 2784845

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

1. අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය)
2. විභාග කොමසාරිස් ජනරාල්
3. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
4. ප්‍රධාන කොමසාරිස් - ගුරු අධ්‍යාපන
5. අධ්‍යාපන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්
6. සාමාන්‍යාධිකාරි, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
7. සභාපති, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ඇමුණුම-I

# රජයේ නිවාඩු දින - 2023

| | | | | |
|---|---|---|---|---|
| ජනවාරි | 06 | සිකුරාදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය | * = |
| ජනවාරි | 15 | ඉරිදා | දෙමළ තෛපොංගල් දිනය | * = |
| පෙබරවාරි | 04 | සෙනසුරාදා | නිදහස් සමරු දිනය | * = |
| පෙබරවාරි | 05 | ඉරිදා | නවම් පුර පසළොස්වක පෝය දිනය | * = |
| පෙබරවාරි | 18 | සෙනසුරාදා | මහා සිව රාත්‍රී දිනය | * = |
| මාර්තු | 06 | සඳුදා | මැදින් පුර පසළොස්වක පෝය දිනය | * = |
| අප්‍රේල් | 05 | බදාදා | බක් පුර පසළොස්වක පෝය දිනය | * = |
| අප්‍රේල් | 07 | සිකුරාදා | මහ සිකුරාදා දිනය | * = |
| අප්‍රේල් | 13 | බ්‍රහස්පතින්දා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය | * = |
| අප්‍රේල් | 14 | සිකුරාදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය | * = |
| අප්‍රේල් | 22 | සෙනසුරාදා | ඊදුල් ෆිතර් (රාමසාන් දිනය) | * = |
| මැයි | 01 | සඳුදා | ලෝක කම්කරු දිනය | * = |
| මැයි | 05 | සිකුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය | * = |
| මැයි | 06 | සෙනසුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය | * = |
| ජුනි | 03 | සෙනසුරාදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය | * = |
| ජුනි | 29 | බ්‍රහස්පතින්දා | ඊදුල් අල්හා (හජ්ජි උත්සව දිනය) | * = |
| ජූලි | 03 | සඳුදා | අධි ඇසළ පුර පසළොස්වක පෝය දිනය | * = |
| අගෝස්තු | 01 | අඟහරුවාදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය | * = |
| අගෝස්තු | 30 | බදාදා | නිකිණි පුර පසළොස්වක පෝය දිනය | * = |
| සැප්තැම්බර් | 28 | බ්‍රහස්පතින්දා | මිලාද්-උන්-නබි) නබි නායකතුමාගේ උපන් දිනය | * = |
| සැප්තැම්බර් | 29 | සිකුරාදා | බිනර පුර පසළොස්වක පෝය දිනය | * = |
| ඔක්තෝබර් | 28 | සෙනසුරාදා | වප් පුර පසළොස්වක පෝය දිනය | * = |
| නොවැම්බර් | 12 | ඉරිදා | දීපවාලී උත්සව දිනය | * = |
| නොවැම්බර් | 26 | ඉරිදා | ඉල් පුර පසළොස්වක පෝය දිනය | * = |
| දෙසැම්බර් | 25 | සඳුදා | නත්තල් උත්සව දිනය | * = |
| දෙසැම්බර් | 26 | අඟහරුවාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය | * = |

* රජයේ නිවාඩු දින        = බැංකු නිවාඩු දින

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/06/05/01-2023

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.04. 24

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

**පාසල් වාර සටහන - 2023**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 10/2023 හා 2023.03.17 දිනැති චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

2022 - අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය 2023.05.29 දින සිට 2023.06.08 වන දින දක්වා පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින්, පළමු පාසල් වාරයේ දෙවන අදියර අවසන් වන දිනය හා තෙවන අදියර ආරම්භ වන දිනය පහත පරිදි සංශෝධනය කරනු ලබන බව කාරුණික ව දන්වා සිටිමි.

| සිංහල හා දෙමළ පාසල් සඳහා | |
|---|---|
| පළමුවන වාරය | <u>දෙවන අදියර</u><br>2023.04.17 සඳුදා දින සිට 2023.05.26 සිකුරාදා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.05.27 දින සිට 2023.06.11 වන දින දක්වා 2022- අ.පො.ස.( සාමාන්‍ය පෙළ) විභාගය සඳහා නිවාඩු ලබා දෙනු ලැබේ)**<br><br><u>තෙවන අදියර</u><br>2023.06.12 සඳුදා දින සිට 2023.07.21 සිකුරාදා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.07.22 හා 2023.07.23 යන දෙදින නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| මුස්ලිම් පාසල් සඳහා | |
| පළමුවන වාරය | <u>පළමු අදියර</u><br>2023.04.24 සඳුදා දින සිට 2023.05.26 සිකුරාදා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.05.27 දින සිට 2023.06.11 වන දින දක්වා 2022- අ.පො.ස.( සාමාන්‍ය පෙළ) විභාගය සඳහා නිවාඩු ලබා දෙනු ලැබේ)**<br><br><u>දෙවන අදියර</u><br>2023.06.12 සඳුදා දින සිට 2023.07. 21 සිකුරාදා දින දක්වා (දෙදිනම ඇතුළු ව)<br>**(2023.07.22 හා 2023.07.23 යන දෙදින නිවාඩු ලබා දෙනු ලැබේ)** |

2022 අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සිසු සිසුවියන්ගේ අධ්‍යයන වර්ෂය අවසන් වී ඇති බැවින්, එම සිසු සිසුවියන් සඳහා සම්මන්ත්‍රණ හෝ වෙනත් විකල්ප ක්‍රම මගින් වැඩිදුරටත් විෂය කරුණු ඉගැන්වීම හෝ පුනරීක්ෂණ පැවැත්වීම සඳහා කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் +94112784832 +94112784825
ලේකම් / செயலாளர் +94112784811 +94112785162

# 2023 පාසල් ක්‍රියාකාරකම් ඇතුළත් දින දර්ශනය

## 1 වන වාරය

| මාසය | දිනය | වැඩසටහන | වගකීම | ප්‍රගතිය<br>ඉටු කර ඇත/නැත |
|---|---|---|---|---|
| මාර්තු | 26 ඉරිදා | දහම් පාසල් 6-10 ශ්‍රේණි විභාගය | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | |
| ***මාර්තු*** | ***27 සඳුදා*** | ***සිංහල හා දෙමළ පාසල් සඳහා 2023 නව පාසල් වාරය ආරම්භ වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| මාර්තු | 28 අඟහරුවාදා | 01 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම (සිංහල හා දෙමළ පාසල් සඳහා) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති | |
| මාර්තු | 31 සිකුරාදා | පාසල් ක්‍රීඩා වර්ණ ප්‍රදානෝත්සවය | අධ්‍යාපන අමාත්‍යාංශයේ, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව/ පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ විදුහල්පති | |
| අප්‍රේල් | ***04 අඟහරුවාදා*** | ***සිංහල හා දෙමළ පාසල්වල පළමුවන වාරයේ පළමු අදියර අවසන් වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| අප්‍රේල් | ***17 සඳුදා*** | ***සිංහල හා දෙමළ පාසල්වල පළමුවන වාරයේ දෙවන අදියර ආරම්භ වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| ***අප්‍රේල්*** | ***24 සඳුදා*** | ***මුස්ලිම් පාසල්වල සඳහා 2023 නව පාසල් වාරය ආරම්භ වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| අප්‍රේල් | 25 අඟහරුවාදා | 01 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම (මුස්ලිම් පාසල් සඳහා) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති | |
| අප්‍රේල් | 25 අඟහරුවාදා | ලෝක මැලේරියා දිනය පිළිබඳ සිසුන් දැනුම්වත් කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව/ පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ සෞඛ්‍ය විදුහල්පති | |

| මාසය | දිනය | වැඩසටහන | වගකීම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | | | ඉටු කර ඇත/නැත |
| මැයි | 04 බ්‍රහස්පතින්දා | අප්‍රේල් 22 වන දිනට යෙදෙන රාමසාන් උත්සවය නිමිත්තෙන් පැවැත්වීමට නියමිත ජාතික උත්සවය සියඹලාගස්කොටුව මදීනා ජාතික පාසලේ | අධ්‍යාපන අමාත්‍යාංශයේ මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව | |
| මැයි | 08 සඳුදා | ලෝක තැලසීමියා දිනය පිළිබඳ සිසුන් දැනුම්වත් කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව/ විදුහල්පති | |
| ***මැයි*** | ***26 සිකුරාදා*** | ***සියලුම පාසල් සඳහා පළමුවන වාරයේ දෙවන අදියර අවසන් වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| මැයි | 29 සඳුදා සිට ජුනි 08 බ්‍රහස්පතින්දා දක්වා | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය 2022 (2023) | විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග ශාඛාව | |
| ***ජුනි*** | ***12 සඳුදා*** | ***සියලුම පාසල් සඳහා පළමුවන වාරයේ තෙවන අදියර ආරම්භ වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| ජුනි | 15 බ්‍රහස්පතින්දාට පෙර | කලාප ක්‍රීඩා තරග | අධ්‍යාපන අමාත්‍යාංශයේ, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව/ පළාත්/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ විදුහල්පති | |
| ජුනි | 17 සෙනසුරාදා | දහම් පාසල් ගුරු විභාගය | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | |
| ජුනි | 24 සෙනසුරාදා සිට 26 සඳුදා දක්වා | සහය දිවීමේ තරගාවලිය | අධ්‍යාපන අමාත්‍යාංශයේ, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව/ පළාත්/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ විදුහල්පති | |
| ජූලි | 04 අඟහරුවාදා සිට 07 සිකුරාදා දක්වා | වාණිජ සතිය | අධ්‍යාපන අමාත්‍යාංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව/විදුහල්පති | |
| ජූලි | 05 බදාදා | වාණිජ දිනය | අධ්‍යාපන අමාත්‍යාංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව/විදුහල්පති | |

| මාසය | දිනය | වැඩසටහන | වගකීම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | | | ඉටු කර ඇත/නැත |
| ජූලි | 19 බදාදා | මුහර්රම් (ඉස්ලාමීය අලුත් අවුරුදු) සැමරුම් උත්සවය කො/හමීද් අල් හුසෙනි විද්‍යාලය | අධ්‍යාපන අමාත්‍යාංශයේ මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව | |
| ***ජූලි*** | ***21 සිකුරාදා*** | ***සියලු පාසල්වල පළමුවන වාරය අවසන් වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| ජූලි | 23 ඉරිදා | දහම් පාසල් තුළ සිසු නිපුණතා ඇගයීම | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | |

## 2 වන වාරය

| මාසය | දිනය | වැඩසටහන | වගකීම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | | | ඉටු කර ඇත/නැත |
| ***ජූලි*** | ***24 සඳුදා*** | ***සියලු පාසල්වල දෙවන වාරය ආරම්භ වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| ජූලි | 25 අඟහරුවාදා සිට 30 ඉරිදා දක්වා | සමස්ත ලංකා පාසල් බටහිර සංගීත තරඟය (පළාත්) | අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව | |
| ජූලි | 29 සෙනසුරාදා | ජාතික ගණිත ඔලිම්පියාඩ් පුහුණු සංචිතයට සිසුන් තෝරා ගැනීමේ පරීක්ෂණය | අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/ විදුහල්පති | |
| අගෝස්තු | 04 සිකුරාදා සිට 06 ඉරිදා දක්වා | සමස්ත ලංකා පාසල් බටහිර සංගීත තරඟය (ජාතික) | අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව | |
| අගෝස්තු | 06 ඉරිදා | දහම් පාසල් දින සැමරුම් උත්සවය | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | |
| අගෝස්තු | 12 සෙනසුරාදා හා 13 ඉරිදා | සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරඟය (භූමි දර්ශන සිතුවම් කිරීම) | අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව | |
| අගෝස්තු | 27 ඉරිදා | ප්‍රාදේශීය සිසු නිපුණතා ඇගයීම | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | |
| සැප්තැම්බර් | 01 සිකුරාදා සිට 30 සෙනසුරාදා දක්වා | ජාතික සාහිත්‍ය මාසය - සාහිත්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ශාඛාව පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/විදුහල්පති | |
| සැප්තැම්බර් | 02 සෙනසුරාදා හා 03 ඉරිදා | සමස්ත ලංකා පාසල් නර්තන සහ කථක් තරඟය | අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව | |

| මාසය | දිනය | වැඩසටහන | වගකීම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | | | ඉටු කර ඇත/නැත |
| සැප්තැම්බර් | 02 සෙනසුරාදා සිට 08 සිකුරාදා දක්වා | ජාත්‍යන්තර සාක්ෂරතා දිනය (සාක්ෂරතා සතියක් ප්‍රකාශයට පත්කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව | |
| සැප්තැම්බර් | 07 බ්‍රහස්පතින්දා | ලෝක ප්‍රථමාධාර දිනයට සමගාමීව පාසල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව/ විදුහල්පති | |
| සැප්තැම්බර් | 10 ඉරිදා ට පෙර | පළාත් ක්‍රීඩා තරග | අධ්‍යාපන අමාත්‍යාංශයේ, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ විදුහල්පති | |
| සැප්තැම්බර් | 15 සිකුරාදා සිට 17 ඉරිදා දක්වා | සමස්ත ලංකා පාසල් ක්‍රීඩා අදියර I | අධ්‍යාපන අමාත්‍යාංශයේ, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව/ පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ විදුහල්පති | |
| සැප්තැම්බර් | 16 සෙනසුරාදා හා 17 ඉරිදා | සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය (ලිඛිත) - පළාත් මට්ටම | අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව | |
| සැප්තැම්බර් | 21 බ්‍රහස්පතින්දා | අන්තර් ජාතික සාම දිනය | අධ්‍යාපන අමාත්‍යාංශයේ සාම අධ්‍යාපන හා සංහිඳියා ඒකකය | |
| සැප්තැම්බර් | 21 බ්‍රහස්පතින්දා හා 22 සිකුරාදා | සමස්ත ලංකා ගණිත තරගාවලිය (කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ - I කාණ්ඩය) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව | |
| සැප්තැම්බර් | 23 සෙනසුරාදා | සමස්ත ලංකා/ ජාතික සමාජ විද්‍යා තරගාවලිය | අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව | |
| සැප්තැම්බර් | 22 සිකුරාදා සිට 25 සඳුදා දක්වා | සමස්ත ලංකා පාසල් ක්‍රීඩා අදියර I I | අධ්‍යාපන අමාත්‍යාංශයේ, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව/ පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ විදුහල්පති | |
| සැප්තැම්බර් | 24 ඉරිදා | දිස්ත්‍රික් සිසු නිපුණතා ඇගයීම | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | |
| සැප්තැම්බර් | 30 සෙනසුරාදා හා ඔක්තෝම්බර් 01 ඉරිදා | සමස්ත ලංකා පාසල් කර්ණාටක සංගීත තරගය | අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව | |

| මාසය | දිනය | වැඩසටහන | වගකීම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | | | ඉටු කර ඇත/නැත |
| ඔක්තෝම්බර් | 01 ඉරිදා | විශ්ව ළමා දිනය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/ විදුහල්පති | |
| ඔක්තෝබර් | 01 ඉරිදා සිට 31 අඟහරුවාදා දක්වා | ජාතික කියවීම් මාසය - කියවීම් ප්‍රවර්ධන කුසලතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ශාඛාව පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/විදුහල්පති | |
| ඔක්තෝබර් | 04 බදාදා | සැප්තැම්බර් 28 දිනට යෙදෙන "මීලා-දුන්-නබි" (මෙහොමඩ් නබිතුමාගේ උපන්දිනය) වෙනුවෙන් සැමරුම් උත්සවය අක්කරපත්තුව මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය | අධ්‍යාපන අමාත්‍යාංශයේ මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව | |
| ඔක්තෝබර් | 06 සිකුරාදා | ලෝක ගුරු දිනයට සමගාමීව ජාතික ගුරු දිනය සැමරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව | |
| ඔක්තෝබර් | 07 සෙනසුරාදා හා 08 ඉරිදා | දෙවන ජාතික භාෂා (සිංහල/දෙමළ) තරගාවලිය - පළාත් මට්ටම (ලිඛිත තරඟ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව | |
| ඔක්තෝබර් | 10 අඟහරුවාදා | ලෝක මානසික සෞඛ්‍ය දිනය පිළිබඳ පාසල් සිසුන් දැනුම්වත් කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව/ විදුහල්පති | |
| ඔක්තෝබර් | 13 *සිකුරාදා* | ආචාර්ය සී.ඩබ්.ඩබ්.කන්නන්ගර ශ්‍රීමතාණන්ගේ 138වන ජන්ම දින සමරු වැඩසටහන | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව | |
| ඔක්තෝබර් | ***13 සිකුරාදා*** | ***සිංහල හා දෙමළ පාසල්වල දෙවන වාරය අවසන් වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| ඔක්තෝබර් | 15 ඉරිදා | 2023-05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය | විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග ශාඛාව | |
| ඔක්තෝබර් | 16 සඳුදා සිට නොවැම්බර් 10 සෙනසුරාදා දක්වා | 2023 අ.පො.ස. (උ/පෙළ) විභාගය | විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග ශාඛාව | |
| ඔක්තෝබර් | 19 බ්‍රහස්පතින්දා හා 20 සිකුරාදා | සමස්ත ලංකා ගණිත තරගාවලිය (ජ්‍යෙෂ්ඨ - II කාණ්ඩය හා විද්‍යායතන පිරිවෙන්) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව | |

| මාසය | දිනය | වැඩසටහන | වගකීම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | | | ඉටු කර ඇත/නැත |
| ඔක්තෝබර් | 25 බදාදා | පාසල් පුස්තකාල දිනය - පාසල් පුස්තකාල දිනයට සමගාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ශාඛාව පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/විදුහල්පති | |
| ඔක්තෝබර් | 25 බදාදා සිට 28 සෙනසුරාදා දක්වා | පාසල් පුස්තකාල සතිය - පාසල් පුස්තකාල ආශ්‍රිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ශාඛාව පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/විදුහල්පති | |
| ***ඔක්තෝබර්*** | ***31 අඟහරුවාදා*** | ***මුස්ලිම් පාසල් සඳහා දෙවන වාරය අවසන් වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| නොවැම්බර් | 04 සෙනසුරාදා හා 05 ඉරිදා | සමස්ත ලංකා ඉංග්‍රීසි භාෂා හා නාට්‍ය තරඟාවලිය | අධ්‍යාපන අමාත්‍යාශයේ ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව | |
| නොවැම්බර් | 11 සෙනසුරාදා 12 ඉරිදා | සමස්ත ලංකා පාසල් සංගීත තරගය | අධ්‍යාපන අමාත්‍යාශයේ සෞන්දර්ය ශාඛාව | |

# 3 වන වාරය

| මාසය | දිනය | වැඩසටහන | වගකීම | ප්‍රගතිය<br>ඉටු කර ඇත/නැත |
|---|---|---|---|---|
| ***නොවැම්බර්*** | ***13 සඳුදා*** | ***සියලුම පාසල් සඳහා තෙවන වාරය පළමු අදියර ආරම්භ වීම*** | ***පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති*** | |
| නොවැම්බර් | 14 අඟහරුවාදා | ලෝක දියවැඩියා දිනයට සමගාමීව පාසල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව/ විදුහල්පති | |
| නොවැම්බර් | 17 සිකුරාදා සිට 20 සඳුදා දක්වා | සමස්ත ලංකා පාසල් ක්‍රීඩා අදියර I I I | අධ්‍යාපන අමාත්‍යාංශයේ, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ විදුහල්පති | |
| නොවැම්බර් | 18 සෙනසුරාදා | ජාතික තරුණ තූර්ය වාදක මණ්ඩල සංදර්ශනය | අධ්‍යාපන අමාත්‍යාශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව | |
| නොවැම්බර් | 18 සෙනසුරාදා හා 19 ඉරිදා | සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල (සිංහල මාධ්‍යය) | අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව | |
| නොවැම්බර් | 18 සෙනසුරාදා හා 19 ඉරිදා | සමස්ත ලංකා දෙමළ භාෂා තරගාවලිය (ලිඛිත/වාචික තරඟ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව | |
| නොවැම්බර් | 23 බ්‍රහස්පතින්දා | සමස්ත ලංකා කෘෂි දැනුම මිනුම තරඟය | අධ්‍යාපන අමාත්‍යාංශයේ කෘෂිකර්ම හා පරිසර අධ්‍යායන ශාඛාව | |
| නොවැම්බර් | 25 සෙනසුරාදා හා 26 ඉරිදා | සමස්ත ලංකා දෙමළ භාෂා තරගාවලිය (ලිඛිත/වාචික තරඟ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව | |
| නොවැම්බර් | 27 සඳුදා සිට දෙසැම්බර් 03 ඉරිදා දක්වා | ජාත්‍යාන්තර ආබාධිත දිනය (ජාත්‍යාන්තර ආබාධිත දින සතියක් ප්‍රකාශයට පත්කිරීම) | අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව | |
| නොවැම්බර් | 29 බදාදා සිට දෙසැම්බර් 03 ඉරිදා දක්වා | සමස්ත ලංකා පාසල් මලල ක්‍රීඩා | අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ විදුහල්පති | |

| මාසය | දිනය | වැඩසටහන | වගකීම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | | | ඉටු කර ඇත/නැත |
| නොවැම්බර් | 30 බ්‍රහස්පතින්දා | සමස්ත ලංකා ගෘහ ආර්ථික විද්‍යා ජාතික තරඟය | අධ්‍යාපන අමාත්‍යාශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව | |
| දෙසැම්බර් | 01 සිකුරාදා | ලෝක ඒඩ්ස් දිනට සමගාමීව පාසල් සිසුන් දැනුවත් කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව/ පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ සෞඛ්‍ය ප්‍රවර්ධන සම්බන්ධීකරණ නිලධාරීන්/ විදුහල්පති | |
| දෙසැම්බර් | 02 සෙනසුරාදා හා 03 ඉරිදා | සිංහල භාෂාව හා සාහිත්‍ය තරග - සමස්ත ලංකා හා ජාතික මට්ටම (වාචික තරග) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව | |
| දෙසැම්බර් | 05 අඟහරුවාදා | සමස්ත ලංකා පාසල් රෝබෝ තාක්ෂණ හා නව නිර්මාණ තරඟාවලිය | අධ්‍යාපන අමාත්‍යාශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව | |
| දෙසැම්බර් | 09 සෙනසුරාදා හා 10 ඉරිදා | සමස්ත ලංකා පාසල් භරත නාට්‍යම් තරගය | අධ්‍යාපන අමාත්‍යාශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව | |
| දෙසැම්බර් | 09 සෙනසුරාදා හා 10 ඉරිදා | සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟාවලිය - සමස්ත ලංකා හා ජාතික මට්ටම (වාචික තරග) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව | |
| දෙසැම්බර් | 16 සෙනසුරාදා 17 ඉරිදා | සමස්ත ලංකා ඉංග්‍රීසි භාෂා හා නාට්‍ය තරඟාවලිය | අධ්‍යාපන අමාත්‍යාශයේ ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව | |
| දෙසැම්බර් | 16 සෙනසුරාදා 17 ඉරිදා | සමස්ත ලංකා දෙවන භාෂා තරගාවලිය (වාචික තරඟ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව | |
| දෙසැම්බර් | 22 සිකුරාදා සිට 24 ඉරිදා දක්වා | සමස්ත ලංකා සිසු නිපුණතා ඇගයීම | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | |
| *ජනවාරි* | ***02** අඟහරුවාදා* | *සියලුම පාසල් සඳහා තෙවන වාරය දෙවන අදියර ආරම්භ වීම* | *පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති* | |
| *පෙබරවාරි* | ***09** සිකුරාදා* | *සියලුම පාසල් සඳහා තෙවන වාරය අවසන් වීම* | *පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/ විදුහල්පති* | |

**<u>සැළකිය යුතු වැදගත් කරුණු</u>**

01. මෙහි අඩංගු වැඩසටහන් පවතින තත්වය අනුව වරින්වර වෙනස් විය හැක. එසේ වෙනස් වන්නේ නම් පසුව දැනුම් දීමට කටයුතු කෙරේ.

02. 2023 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ඉරිදා දින උදය වරුව යොදා ගැනීමෙන් වැළකිය යුතුය.

03. කිසියම් හේතුවක් මත ඉහත කී වැඩසටහන් පවත්වන දිනයන්හි වෙනසක් සිදු වේ නම් ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව දැනුවත් කළ යුතුය.

04. පාසල් ක්‍රීඩා සංගම් විසින් පවත්වනු ලබන තරග, පාසල් දින දර්ශනයේ සඳහන් දිනයන් හැර වෙනත් දිනයන්හි පමණක් පැවැත්විය යුතුය.

## විදුහල්පතිවරුන්ගේ විශේෂ අවධානයට

1. මෙම වාර සටහනෙහි වගකීම් දරන්නන් විසින් තම කාර්යයන් නිම කිරීම පිළිබඳ ප්‍රගතිය තීරුවෙහි සටහන් කළ යුතු අතර පාසලට පැමිණෙන අධීක්ෂණ නිළධාරීන්ගෙන් අත්සන් ලබාගෙන එය තහවුරු කළ යුතු ය.

2. තුන්වන වාරයේ දී පාසල්වල අධ්‍යාපන කටයුතුවලට ප්‍රමුඛතාවය හිමිවිය යුතු බැවින්, ඔබ පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය, විවිධ දින (උදා - වාණිජ, විද්‍යා, .....ආදි ලෙස), වාර්ෂික අධ්‍යාපන චාරිකා/ක්ෂේත්‍ර චාරිකා ආදිය පළමුවන හා දෙවන වාර තුළ දී පමණක් සිදුකළ යුතු ය.

3. සියලු ම භාෂා හා අනිකුත් තරඟ (සිංහල, ඉංග්‍රීසි, දෙමළ, සමාජ විද්‍යා, චිත්‍ර, නැටුම්, සංගීතය, නාට්‍ය හා රංග කලා.....) පාසල් මට්ටමින් නියමිත දිනවල පවත්වා කොට්ඨාශ හා කලාප තරඟ සඳහා ළමුන් ඉදිරිපත් කිරීමට සෑම විදුහල්පතිවරයෙකු ම වග බලා ගත යුතු ය.

4. පාසල් වාර විභාගයේ ඇගයීම් ලකුණු පාසල් වාර නිවාඩුවට පෙර සිසුනට ලබාදීමට කටයුතු කළ යුතුය.

5. වාර්ෂික ව අභ්‍යන්තර භාණ්ඩ සමීක්ෂණයක් තම කාර්ය මණ්ඩල යොදවා ගනිමින් අනිවාර්යයෙන් ම සිදු කළ යුතු වේ.

6. 2014/ 31 චක්‍රලේඛයට සහ "අපේ පාසල කොතරම් ගුණාත්මක ද" මාර්ගෝපදේශයට අනුව පාසල තුළ අභ්‍යන්තර ඇගයීම් වර්ෂය පුරා සෑම පාසලකම සිදු කළ යුතු ය.

7. "ගුරු ප්‍රතිභා ප්‍රභා" වාර්ෂික ගුරු හා විදුහල්පති ඇගයීම් උළෙල සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරන ලද සියලු ගුරු භවතුන් ඒ පිළිබඳව දැනුම්වත් කළ යුතු ය.

8. 2015 වර්ෂයෙහි සිට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් හඳුන්වා දෙන ලද ගුරු වාර්තා පොත යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා සියලු ම ගුරුභවතුන් දැනුම්වත් කිරීම සිදු කළ යුතු ය.

සැකසුම:

පාසල් කටයුතු ශාඛාව
පාසල් කටයුතු අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය